දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජූනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

දේවිසා 2.2 - රාජ්‍ය පරිපාලනයේ මූලිකාංග
PSG 2.2 - Elements of Public Administration

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය

---

01. රාජ්‍ය පරිපාලනය නිර්වචනය කොට අධ්‍යයන විෂයක් ලෙස එහි සංවර්ධනය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. රාජ්‍ය පරිපාලනය හා දේශපාලනය අතර ඇති වෙනස්කම් විස්තර කොට පරිපාලනය දේශපාලනීකරණය වීමේ විවිධ ආකාර පෙන්වා දෙන්න.

(ලකුණු 20)

03. "රාජ්‍ය පරිපාලනය සහ ව්‍යාපාර පරිපාලනය 'පරිපාලනය' නැමති පොදු විෂයේ ප්‍රභේද දෙකක් වුව ද ඒවා අතර වෙනස්කම් රැසක් පවතී" විභාග කරන්න.

(ලකුණු 20)

04. (අ) මැක්ස් වෙබර්ගේ නිලබල ක්‍රමයේ මූලික ලක්‍ෂණ මොනවා ද?

(ආ) විද්‍යුත් පරිපාලන ප්‍රතිසංස්කරණ මගින් නිලබල සංවිධානයට සිදුකොට ඇති බලපෑම විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 10 බැගිනි)

05. පරිපාලන සංවිධාන මූලධර්ම අතුරින් පහත සඳහන් ඕනෑම දෙකක් විභාග කරන්න.
(අ) සංවිධාන ධූරාවලිය
(ආ) අණදීමේ ඒකීයත්වය
(ඇ) සම්බන්ධීකරණය
(ඈ) සීමිත හැසිරවීමේ ප්‍රමාණය

(ලකුණු 10 බැගිනි)

06. බ්‍රිතාන්‍ය සිවිල් සේවාවේ සංවර්ධනයට ෆුල්ටන් කමිටු වාර්තාව (1968) මගින් සිදු වූ දායකත්වය පෙන්වා දෙන්න.

(ලකුණු 20)

07. "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය නූතන රාජ්‍ය පරිපාලනයේ කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය නව මඟකට යොමු කොට තිබේ" ඔබ එකඟවන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

08. වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල සහ කාර්යභාරය විභාග කරන්න.

(ලකුණු 20)

09. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය ප්‍රතිසංස්කරණය කිරීමේ දී අවධානයට ලක්විය යුතු මූලික කාරණා විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම දෙකක් කෙටියෙන් විභාග කරන්න.

(අ) එෆ්.ඩබ්. ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණවාදය

(ආ) ශ්‍රී ලංකාවේ පළාත් පරිපාලනය

(ඇ) නව රාජ්‍ය කළමනාකරණය

(ඈ) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ ක්‍රියාකාරිත්වය